# ඉන්දියානු භූමිකාවේ පරස්පර ප්‍රවණතා

ඉන්දියාව යළිත් ලංකාවේ ප්‍රචණ්ඩ සමාජ-දේශපාලන වා සුළියේ හරි මැදට ඇදෙමින් තිබේ. ඉන්දියානු බලපෑම් පරාජය කරන්නට එකිනෙකා පරයමින් තරඟයේ යෙදෙන 'ජාතිමාමක බලවේගයන්ගේ' වහසි බස්, කොළඹ සිංහල දේශපාලනයේ ගරු කටයුතු සටන් පාඨ බවට පෙරළෙමින් ඇත්තේ ඒ හේතුවෙනි. නොවැම්බර් මුල් සතියේදී ජාතික නිදහස් පෙරමුණ සහ ජාතික හෙළ උරුමය ඒකාබද්ධව කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවට කැඳවා තිබූ සම්මන්ත්‍රණයකදී අදහස් දක් වූ කථිකයෝ 'ඇමරිකානු මෙන්ම ඉන්දියානු බලපෑම්වලට යට වී කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව ගෙනයන අවසාන සටන ආපස්සට හරවන්නට කෙසේවත් ඉඩ නොදෙන්නෙමු'යි ශපථ කර කියා සිටියහ. *(ඒ අතරවාරයේ නිව්යෝක් නගරයේදී ජනමාධ්‍ය ඇමතූ එක්සත් ජනපද නාවුක හමුදාවේ ශාන්තිකර කලාපීය ඒකාබද්ධ මූලස්ථානයේ ආඥාපති අද්මිරාල් තිමති කීටිං, 'එක්සත් ජනපදය විසින් තහනම් කොට ඇති කොටි සංවිධානයට එරෙහිව ශ්‍රී ලංකා රජයේ හමුදා විසින් මෑතදී ලබාගත් යුද ජයග්‍රහණයන් ඉතාම ප්‍රශංසා කටයුතු බවට' ප්‍රසාදය පළකර සිටි බවද කරුණාවෙන් සළකන්න!)*

ජාතිපෙ සහ හෙළ උරුමයේ ඒකාබද්ධ දිවුරුමෙන් සතියක් ඇතුළතදී කොළඹ විහාර මහා දේවී එළිමහන් රංග පීඨයට රොක් වූ ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් සහ ආධාරකරුවන් අමතා කතා කළ ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ මෙසේ කියා සිටියේය: ''ඉන්දියා බලපෑම මෙවර ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන්නේ එක්සත් ජනපද සහ ඉන්දීය උපාය මාර්ගයක් වශයෙනුයි. ඉන්දියාවට අවශ්‍ය ශ්‍රී ලංකාව ඉන්දියාවේ අතවැසි රාජ්‍යයක් බවට පත් කරගන්නයි...ලෝක ජනගහණයෙන් වැඩිම පිරිසක් බඩගින්නේ ඉන්න ජනතාවක් ඉන්නේ ඉන්දියාවේ. එහෙව් රටක්ද අපිට මේ පාට් දාන්න එන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ අපි ඉන්නකම් මේ රට පාවා දෙන්න ඉඩ තියන්නේ නැහැ.'' (*දිවයින - 2008 නොවැම්බර් 17*) බැලූ බැල්මට මෙවර 'ඉන්දියානු මැදිහත්වීමෙන් ලංකාව බේරා ගැනීමට සෑහෙන බලවේග ප්‍රමාණයක් දැන් සිටම පෙළ ගැසෙන බව පෙනෙන්නට තිබේ. ලංකාව ඉන්දියානු බලපෑමෙන් ගළවා ගන්නේ කවුද යන්න තීරණය කිරීමට එකිනෙකා හා යුද්ධ ප්‍රකාශ කරනු පෙනෙන්නේ එබැවිනි. ඇතැම් විට ක්‍රමානුකූලව වර්ධනය වීමට ඉඩ තිබෙන ඉන්දීය විරෝධී පොදුජන මානසිකත්වයක තනි අයිතිය ජවිපෙ සතුවීම වළක්වමින් එය රාජ්‍යය තුළටම කළමනාකරණය කරගැනීමේ උවමනාව, ජාතිපෙ සහ හෙළ උරුමයේ හදිසි ඉන්දීය විරෝධී ක්‍රියාමාර්ග පිටපුස සැඟව ඇති බවට සැක නැත. නමුත් හතරවෙනි ඊළම් යුද්ධය කෙරෙහි වන ඉන්දියානු පිළිවෙත පිළිබඳ යට කී බලවේග සියල්ල විසින් පොදුවේ දකුණේ සිංහල ජන කොටස් අතර ගොඩ නංවන චිත්‍රය, ඊට අදාළ සැබෑ සංකීර්ණතා ඕනෑකමින් වසන් කරන සටකපට එකකි.

ලෝකය 'අපි සහ කොටි' වශයෙන් දෙපළු කොටගත් අපේ සමකාලීන කොදෙව් වැසියාගේ දැනුමේ ආවේණික සීමාව ඇත්ත වශයෙන්ම නොදැනුමයි. ශ්‍රී ලංකාවේ යුද්ධය මුල්කොටගෙන ඉන්දියානු ජාතික දේශපාලනය තුළ නිර්මාණය වෙමින් තිබෙන පෙර නොවූ විරූ ධ්‍රැවීකරණය ලංකාවේ බහුතරයක් සිංහල ජනයාට රහසක්ව ඇත්තේ ඒ හේතුවෙනි.

## කේන්ද්‍රය සහ පරිධිය අතර වැඩෙන ආතතිය

හතරවෙනි ඊළම් යුද්ධය අරභයා ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ පිළිවෙත පිළිබඳ සැළකිය යුතු සවිස්තරාත්මක විග්‍රහයක් ඉකුත් සැප්තැම්බර් 14 වෙනිදා 'රාවය' පුවත්පතට මෙම ලියුම්කරු විසින් සපයන ලද ලිපියෙහි අන්තර්ගතව තිබේ. එහෙයින් එකී කරුණු නැවත ලිවීමට මෙහිදී අපේක්ෂා නොකෙරේ. කෙසේ වුවද එකී කරුණුවල සාරය වූයේ රාජපක්ෂ රජයේ යුදමය නැඹුරුව කෙරෙහි ඉන්දියානු රජය දක්වන සැඟවිය නොහැකි අනුග්‍රහශීලී පිළිවෙතයි. මානව හිමිකම් සහ මානුෂීය අවශ්‍යතා පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රකාශවලින් වසන් කරනු ලැබූවද ශ්‍රී ලංකාවේ රාජ්‍ය යුද හස්තය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගිකව වඩාත්ම අනුග්‍රහශීලී පිළිවෙතක් අනුගමනය කරන කලාපීය යුද ආධාරකරුවා බවට ඉන්දියාව දැන් පෙරළී තිබේ. නිදසුනක් වශයෙන්, 2007 පෙබරවාරි 26 වෙනිදා ඉන්දීය අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් නිකුත් කළ ඉන්දු-ශ්‍රී ලංකා සබඳතා පිළිබඳ සම්පිණ්ඩන ලියැවිල්ල, දෙරට අතර වර්ධනය වෙමින් පවතින මෙකී පෙර නොවූ විරූ ආරක්ෂක සබඳතා පිළිබඳ යථාර්ථය කදිමට හකුළා පෙන්වයි. අදාළ ලියැවිල්ලට අනුව දැනටමත් ශ්‍රී ලංකා රජයේ සන්නද්ධ හමුදාවන්ගේ පුහුණු කටයුතුවලින් 53%ක්ම සිදු කෙරෙන්නේ ඉන්දියාව තුළ ය. මේ යටතේ 2005-2006 වකවානුව සඳහා ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට ඉන්දියාව විසින් ප්‍රදානය කරන ලද පුහුණු පාඨමාලා සංඛ්‍යාව 977කි. එමෙන්ම 2006-2007 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාව සඳහා වෙන් කෙරුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 870කි. ඉන් 545ක් ශ්‍රී ලංකා යුද හමුදා සාමාජිකයින් සඳහා වෙන් කරන ලද අතර ඉතිරියෙන් 216ක් නාවුක හමුදාවට ද, 109ක් ගුවන් හමුදාවට ද ලබා දී තිබේ. සිව්වෙනි ඊළම් යුද්ධය තීව්‍ර වූ 2007-2008 කාල වකවානුව සඳහා පුහුණු පාඨමාලා අවස්ථා 2,579කට ඉඩ ලබාදෙන මෙන් ශ්‍රී ලංකා ආරක්ෂක බලධාරීන් 2007 අවුරුද්දේ පෙබරවාරිය වනවිටත් ඉන්දීය රජයෙන් ඉල්ලුම් කොට තිබිණ. *(Ministry of External Affairs BSM Division : Brief on India - Sri Lanka Relations / February 26, 2007)*

දැන් වඩ වඩා පැහැදිලිව පෙනෙන්නට පටන්ගෙන ඇති ඉන්දීය රජයේ යට කී අනුග්‍රහශීලී පිළිවෙතට පිටුබල සපයන නව කලාපීය සහ ගෝලීය යථාර්ථයන් කවරේද යන්න සාකච්ඡා කිරීම දෙවනුව කළ යුත්තකි. මේ මොහොතේදී පළමුව වැදගත් වන්නේ මෙම දැඩි අනුග්‍රහශීලී ප්‍රතිපත්තිය තුලනය කිරීමට අවශ්‍ය පීඩනය ඉන්දියාව තුළින්ම මතුකරනු ලබන සමාජ-දේශපාලන බලවේගයන්ගේ දේශපාලන සංයුතිය නිසියාකාරව වටහා ගැනීමයි. එය වටහා ගැනීමට නම් ඉකුත් මාස දෙක හමාරක කාලය තුළ දකුණුදිග ඉන්දියානු ප්‍රාන්ත පදනම් කොටගෙන ඇවිළ ගිය පෙර නොවූ විරූ තරමේ දැවැන්ත බහුජන ව්‍යාපාරයන්ගේ සුවිශේෂී දේශපාලන ස්වභාවය ගැඹුරින් ග්‍රහණය කරගත යුතු වේ. හතරවෙනි ඊළම් යුද්ධය සම්බන්ධයෙන් ඉන්දියාවේ දේශපාලන බල මධ්‍යය සහ පරිධිය තුළින් මතුවන එකිනෙකට පරස්පර ප්‍රවණතා වටහාගත හැක්කේ ඒ මගිනි.

ඇතැම්විට, මේ ආකාර ආතතීන් සෑම කලකම ඉන්දීය බල දේශපාලනයේ කේන්ද්‍රය සහ පරිවාරය අතර දැකිය හැකිව තිබුණේ යැයි යමෙක් තර්ක කිරීමට ඉඩ තිබේ. නමුත් ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාට සහයෝගය පළකරමින් තමිල්නාඩු ප්‍රාන්තය මුල්කොටගෙන මෙවර ඇවිළ යන පැතිරුණු සහයෝගිතා ව්‍යාපාරයන්ගේ දේශපාලන ස්වභාවයට අදාළව සැළකූ කළ එය සපුරාම සදොස් තර්කයකි. අප තවදුරටත් නරඹමින් සිටින්නේ '80 දශකයේ මැද හා අවසාන භාගයේ දැක පුරුදුව තිබූ, පැරණි දකුණු ඉන්දීය දේශපාලන නාටකයේ නව නිෂ්පාදනයක් නොවන බව සියල්ලටම කලියෙන් අප තේරුම්ගත යුතුව තිබේ. දකුණු ලංකාවේ

වැඩිදෙනා මේ යථාර්ථය වටහාගැනීමෙන් වළකාලන ප්‍රධානතම සාධකය වන්නේ කොළඹ කේන්ද්‍රීයව පළකෙරෙන සිංහල සහ ඉංග්‍රීසි ජනමාධ්‍ය බහුතරයක් මගින් සම්පාදනය කරනු ලබන සාහසික ලෙස සංස්කරණය කරන ලද ප්‍රවෘත්තිමය චිත්‍රයයි.

දකුණු ඉන්දියාව හරහා දන් හමා යමින් ඇත්තේ පෙර නොවූ විරූ තරමින් පැතිරුණු විරෝධයක බහුජන කුණාටුවකි. එය නිරවුල්ව පූර්ණ වශයෙන් දැකීමට සමත් නොවෙතොත්, හතරවෙනි ඊළම් යුද්ධය හා බැඳුණු සංකීර්ණ කලාපීය භූ දේශපාලන යථාර්ථයන් තවදුරටත් සිංහල ජනයාට දුරවබෝධී වනු ඇත. සැප්තැම්බරයේ පටන් ක්‍රමානුකූලව උත්සන්නව නැගෙන දකුණු ඉන්දීය බහුජන දේශපාලන විරෝධතාවන්ගේ ස්වභාවය පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් පළමුව වැදගත් වන්නේ ඒ නිසාය.

**දකුණු ඉන්දීය විරෝධයේ කුණාටුව**

මැතිවරණ ආසන සංඛ්‍යාවට අදාළව සළකතොත්, ඉන්දියාවේ හත්වෙනි විශාලතම ප්‍රාන්තය වන තමිල්නාඩුව, ලියා පදිංචි ඡන්දදායකයින්ගේ සංඛ්‍යාවන්ට අදාළව සළකතොත් හයවෙනි ස්ථානයේ වැජඹෙයි. දළ වශයෙන් ඡන්දදායකයින් 28,000,000කගෙන් සමන්විත තමිල්නාඩු ප්‍රාන්තය මන්ත්‍රීවරු 39 දෙනෙකුගෙන් ඉන්දීය ලෝක් සභාව තුළ නියෝජනය කෙරේ. තමිල්නාඩුව කේන්ද්‍ර කොටගෙන මතුවන කවර හෝ දේශපාලන කුණාටුවක් ඉන්දීය දේශපාලන බල මධ්‍යස්ථානයේ අඩිතාලම් සොළවාලන තීරණාත්මක පීඩනයක් ඇතිකිරීමට සමත්වන්නේ ඒ හෙයිනි.

හතරවෙනි ඊළම් යුද්ධය ආරම්භයේ පටන්ම ඉන්දීය මධ්‍යම ආණ්ඩුව විසින් ශ්‍රී ලංකා රජය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද විවෘත අනුග්‍රහශීලී පිළිවෙත තමිල්නාඩු දේශපාලනය තුළ සැළකිය යුතු කණස්සල්ලක් ජනිත කොට තිබිණ. නමුත් එය විසින් මොළවන ලද විරෝධය හැම විටම ප්‍රකාශයට පත්වූයේ තමිල්නාඩුව තුළ සාම්ප්‍රදායික ඊළම් හිතවාදී බලවේග වශයෙන් සැළකුණු ප්‍රමාණයෙන් කුඩා පක්ෂ හා කණ්ඩායම් හරහා ය. නමුත් මෙකී බල තුලනයේ තීරණාත්මක වෙනසකට මඟ පාදන ලද්දේ 2008 සැප්තැම්බර් 09 වෙනිදා මැදියම ඉක්ම යනවාත් සමගම වවුනියාවේ පිහිටි ශ්‍රී ලංකා යුද හමුදාවේ වන්නි ආඥා මූලස්ථානයට දෙමළ ඊළම් විමුක්ති කොටි ගරිල්ලන් විසින් එල්ල කරන ලද දිවි නසාගැනීමේ ප්‍රහාරය මගිනි. කඳවුර තුළට රහසින් ඇතුල් වූ දස දෙනෙකුගෙන් සමන්විත ගරිල්ලා ප්‍රහාරක කණ්ඩායමේ ප්‍රහාරයන් සමග මනාව සම්බන්ධීකරණය කරන ලද ගුවන් හා කාලතුවක්කු ප්‍රහාරයන් විසින් අනපේක්ෂිත අවිනිශ්චිතතාවක් තුළට රජයේ හමුදා සෙබළ පිරිස් තල්ලු කරන ලදී. මූලික වශයෙන්ම ආඥා මූලස්ථානය තුළ ස්ථාපිත ඉන්දියාවේ නිෂ්පාදිත රේඩාර් උපකරණ ඉලක්ක කොටගෙන එල්ල කරන ලද ප්‍රහාරය සිදු වී පැය කිහිපයක් ඇතුළතදී වැදගත් පුවතක් අන්තර්ජාලය ඔස්සේ අනාවරණය කෙරිණ. ශ්‍රී ලංකා යුද හමුදා කඳවුරේ රේඩාර් මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කළ ඉන්දීය තාක්ෂණඥයින් දෙදෙනෙකු කොටි ගරිල්ලා ප්‍රහාරයෙන් තුවාල ලද බවට අදාළ පුවතින් කියැවිණ. හතරවෙනි ඊළම් යුද්ධයට අදාළව ඉන්දීය රජය විසින් අනුගමනය කරන ලද සහායක පිළිවෙතෙහි ප්‍රායෝගික ස්වභාවය කදිමට අනාවරණය කළ මෙකී ප්‍රවෘත්තිය දකුණු ඉන්දීය දේශපාලන භූමියේ කැළඹීමේ ආරම්භය සළකුණු කළේය.

සැප්තැම්බර් 23 වෙනිදා ද්‍රවිඩ කළහම් පක්ෂයේ නායක කේ.වීරමනිගේ හා විමුක්ති දිවියන්ගේ පක්ෂයේ නායක තිරුමාවලවන්ගේ මූලිකත්වයෙන් චෙන්නායි නුවරට කැඳවන ලද විරෝධතාවක් සඳහා ඒකාරාශී වූ 500කට නොඅඩු ආධාරකරුවෝ ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ පිළිවෙත් කෙරෙහි විරෝධය පාමින් උද්ඝෝෂණය කළහ. සැප්තැම්බර් 30 වෙනිදා පී.එම්.කේ. (පාට්ටලී මක්කල් කච්චි) පක්ෂයේ කැඳවීමෙන් චෙන්නායිහී ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ඉදිරිපිටට රැස් වූ 2000කට ආසන්න විරෝධතාකරුවෝ ශ්‍රී ලංකා රජයට මෙන්ම ඉන්දීය රජයටද යළිත් විරෝධය පෑහ. සාම්ප්‍රදායිකව ඊළම් හිතවාදී බලවේග සේ සැළකුණු මෙකී පක්ෂ හා කණ්ඩායම් විසින් සංවිධානය කරන ලද විරෝධතා දෙස උවමනාවෙන් හැරී බලන්නට ඉන්දීය මධ්‍යම ආණ්ඩුවට විශේෂ හේතුවක් නොතිබිණ. නමුත් ඒවා විසින් සළකුණු කරන ලද්දේ ළඟ එන කුණාටු සමයක පෙර නිමිති බව තේරුම් ගැනීමට ඉන්දීය රාජ්‍ය බළධාරීන්ට බල කෙරුණේ අනතුරුව අනපේක්ෂිත වේගයෙන් පෙළගැසුණු සිදුවීම් මගිනි. සැප්තැම්බර් මාසයේ අවසාන සතියේ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය විසින් නිකුත් කරන ලද නිවේදනයක් මගින් ඔක්තෝබර් 02 වෙනිදා දැවැන්ත උපවාස විරෝධතාවක් කැඳවා තිබිණ. කොමියුනිස්ට් පක්ෂයේ නිවේදනයට වහාම ප්‍රතිචාර දක්වන ලද්දේ දිගුකාලීන කොටි විරෝධියෙකු සේ සැළකුණු සමස්ත ඉන්දීය අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම් පක්ෂයේ නායිකා ජයලලිතා ජෙයරාම් විසිනි. ඔක්තෝබර් 02 වෙනිදා කැඳවා ඇති කොමියුනිස්ට් පක්ෂයේ සත්‍යග්‍ර ව්‍යාපාරයට සහයෝගිතාව පළකරමින් සැප්තැම්බර් 27 වෙනිදා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ප්‍රාන්ත ලේකම් ඩී.පාණ්ඩියන් වෙත ලිපියක් යොමු කර සිටි ඇය, ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාගේ අයිතීන් ආරක්ෂා කිරීම පිණිස සංවිධානය කළ විරෝධතා ව්‍යාපාරයට සිය පක්ෂයේ පූර්ණ සහාය පළ කර සිටියාය.

**කොමියුනිස්ට්වාදීන් සටනට බසියි**

දකුණු ඉන්දියාව කේන්ද්‍ර කොටගෙන නැග එන පැතිරුනු විරෝධයේ වෙනස්වන දේශපාලන සංයුතිය ගැන බැරෑරුම් ලෙස කල්පනා කරන්නට ඉන්දීය මධ්‍යම ආණ්ඩුව පොළඹවන ලද්දේ සාම්ප්‍රදායිකව කොටි විරෝධී ස්ථාවරයක් ඉසිලූ ජයලලිතා වැන්නියකට පවා ගැළවීගත නොහෙන ලෙස වර්ධනය වන දේශපාලන උණුසුම විසිනි. විශේෂයෙන්ම දැවැන්ත බහුජන පදනම් සහිත ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය පැතිරෙන විරෝධතා භූමියට සක්‍රීයව අවතීර්ණ වීම නව දිශාවන් කරා ඊළම් සහයෝගිතා ව්‍යාපාරයේ වැඩීම සළකුණු කළේය.

මහත්මා ගාන්ධිගේ උපන්දිනය යෙදුණු ඔක්තෝබර් 02 වෙනිදාවේ තමිල්නාඩු ප්‍රාන්තයට අයත් සියළුම දිස්ත්‍රික්කයන්හී ප්‍රධාන නගර ආවරණය වන පරිද්දෙන් දැවැන්ත උපවාස විරෝධතාවක් කැඳවීමට ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය සමත් විය. ශ්‍රී ලංකාවට සපයනු ලබන ඉන්දීය යුද ආධාර වහා නවතා දමන මෙන් නවදිල්ලියට බල කරමින් කොයිම්බතූර්හි මුළුදුන් ප්‍රධාන විරෝධතාවට දහස් සංඛ්‍යාත කොමියුනිස්ට් පාක්ෂික ආධාරකරුවෝ සහ වෙනත් දේශපාලන පක්ෂ ක්‍රියාධරයෝ සහභාගී වූහ. කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ප්‍රාන්ත සම ලේකම් සී. මහේන්ද්‍රන්, මාක්ස්වාදී ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ප්‍රාන්ත ලේකම් එන්.වර්ධරාජන් ඇතුළු දකුණු ඉන්දීය ජ්‍යෙෂ්ඨ කොමියුනිස්ට් දේශපාලන ක්‍රියාධරයින් සහ වෙනත් දේශපාලන පක්ෂ නියෝජිතයින් මෙන්ම, සාහිත්‍යකරුවන් සහ කලා ශිල්පීන්ද සහභාගී වූ විරෝධතා රැස්වීම අමතා කතා කළ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ඩී.රාජා මෙසේ කීය: ''ඉන්දීය රජයට එරෙහිව අපි අරගල කරනුයේ හුදෙක් එක්සත් ජනපදය සමඟ එළඹුණු න්‍යෂ්ටික ගිවිසුම සම්බන්ධයෙන් පමණක් නොවන බව පෙන්වා දීමට අපි කැමැත්තෙමු. ශ්‍රී ලංකාව තුළ එය පණ පොවන භූමිකාවටද අපි එක සේ විරුද්ධත්වය පා සිටිමු.'' ඇත්ත වශයෙන්ම ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ ජාතික ලේකම්වරයාගේ ප්‍රකාශය වැදගත් දේශපාලන හැඟවුමක් පළ කර සිටියේය. වර්ධනය වන ඉන්දු-ඇමරිකානු සබඳතා නව තලයකට ගෙනයමින් අත්සන් කෙරුණු න්‍යෂ්ටික ගිවිසුමට විරෝධය පාමින් 2008 ජූලි 09 වෙනිදා ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය සහ ඉන්දීය කොමියුනිස්ට්

පක්ෂය ප්‍රමුඛ ඔවුන්ගේ වාමාංශික ආධාරක කණ්ඩායම් කොංග්‍රස් පක්ෂයේ මූලිකත්වයෙන් යුතු එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආණ්ඩුවට එතෙක් දැක් වූ සහාය ඉවත් කර ගත්හ. ඉන්දු-ඇමරිකානු සබඳතා පිළිබඳ නව සැළසුම්වලට එල්ල වූ දැවැන්තම ප්‍රායෝගික විරෝධතාව එල්ල වූයේ කොමියුනිස්ට් පක්ෂ පුමුඛ වාමාංශික කණ්ඩායම් වෙතිනි. මේ අනුව, ලාංකීය දෙමළ ජනයාට සහාය පළ කරමින් ඔක්තෝබර් 02 වෙනිදා තමිල්නාඩු ප්‍රාන්තය පුරා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය විසින් කැඳවන ලද විරෝධතාව, ඉන්දු-ඇමරිකානු සබඳතාවන්ට එරෙහිව එල්ල කළ විරෝධතා පිළිවෙතම ඉදිරියට ගෙනයාමක් වශයෙන් කොමියුනිස්ට් පක්ෂයේ ලේකම්වරයා විසින්ම හඟවනු ලැබීම වැදගත් වන්නේ ඇයිදැයි ඉදිරියේදී පැහැදිලි කෙරෙනු ඇත.

ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ මැදිහත්වීම දකුණු ඉන්දියාව තුළ ලාංකික දෙමළ ජනයා සම්බන්ධයෙන් එතෙක් පැවැති සහයෝගිතා ක්‍රියාමාර්ගයන්ගේ සීමා මායිම් වේගයෙන් පුළුල් කෙරිණ. තමිල්නාඩු ප්‍රාන්ත මහ ඇමති එම්.කරුණානිධිගේ නායකත්වයෙන් යුතු ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම් පක්ෂය විසින් ඔක්තෝබර් 06 වෙනිදා චෙන්නායිහිදී කැඳවන ලද ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාගේ ප්‍රශ්නය මුල්කොටගත් දැවැන්ත උද්ඝෝෂණ රැළිය එහි ප්‍රතිඵලයකි. රජයේ හමුදා ප්‍රහාර වහාම අත්හිටුවීමටත්, සාම සාකච්ඡා ආරම්භ කිරීමටත් බල කර සිටි ඩී.එම්.කේ. විරෝධතා රැළිය සඳහා දහස් සංඛ්‍යාත ජනයා සහභාගී වූහ. දකුණු ඉන්දියාව තුළ වර්ධනය වෙමින් පැතිරෙන නව බහුජන උද්වේගයන්ගේ උස් රැළි මාලා විසින් නිර්මාණය කරනු ලබන නව දේශපාලන ලීවරයේ වැදගත්කම කොටි සංවිධානය කල් තියා හොඳින් අවබෝධ කරගෙන සිටි බව නිසැක ය.  දකුණු ඉන්දීය ජනයාගේ සහයෝගිතා ක්‍රියාමාර්ග කෙරෙහි දෙමළ ජනයාගේ කෘතවේදීභාවය පළකරන විශේෂ නිවේදනයක් ඔක්තෝබර් 08 වෙනිදා කොටි සංවිධානයේ දේශපාලන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිණ. වැඩෙන උද්‍යෝගය ඉක්මණින් බැස යන බවක් නොපෙනිණ. පැතිරෙන විරෝධතාවන්ගෙන් දුරස්ව සිටීම ප්‍රායෝගිකව කෙතරම් දුෂ්කරව ඇතිද යන්න තවදුරටත් සනාථ කරමින් ඔක්තෝබර් 09 වෙනිදා ජයලලිතා ජෙයරාම් යළිත් වරක් නිවේදනයක් නිකුත් කරනු ලැබීය. දෙමළ ජනයාට සාමාන අයිතීන් සහතික කරමින් ඔවුන් සතු ස්වයං නීර්ණ අයිතිය තහවුරු කිරීමටත්, එක්සත් ශ්‍රී ලංකාවක් තුළ දෙමළ ජනයාට ස්වයං පාලන බලයක් ප්‍රදානය කිරීමටත් අදාළ නිවේදනය මගින් බලකර තිබිණ.

ඒ වනවිටත් විරෝධතා ව්‍යාපාර පෙර නොවූ විරූ ලෙස පැතිර යමින් දෛනික පදනමින් සංවිධානය වීම ඇරඹීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඔක්තෝබර් 10 වෙනිදා ගෝපාලස්වාමී වයිකෝගේ නායකත්වයෙන් විරෝධතා දැක් වූ මරුමලර්චි ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම් පක්ෂයේ ආධාරකරුවෝ 2,000කට වැඩි ප්‍රමාණයක් චෙන්නායි නුවරදී ඉන්දීය පොලිස් අත්අඩංගුවට පත් වූහ. ඇත්ත වශයෙන්ම අත් අඩංගුවට පත්වීම විරෝධතා සැළැස්මේම කොටසක් බව පැහැදිලිව පෙනෙන්නට තිබුණි. ඔක්තෝබර් 14 වෙනිදා ප්‍රාන්ත මහ ඇමති කරුණානිධිගේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාට සහාය පළ කරමින් කැඳවනු ලැබූ පළමු සර්ව පාක්ෂික සමුළුවට ආචාර්ය රාම්දාස්ගේ පී.එම්.කේ. පක්ෂය, තිරුමාවලවන්ගේ විමුක්ති දිවි සංවිධානය, නැදුමාරන්ගේ දෙමළ ජාතික ව්‍යාපාරය ප්‍රමුඛ ප්‍රධාන ඊළම් හිතවාදී පක්ෂ හැරුණු විට ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ මෙන්ම ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේද, සමස්ත ඉන්දීය පෙරටුගාමී පක්ෂය සහ තමිල්නාඩු මුස්ලිම් මුන්නේත්‍ර කළහම් පක්ෂයේද නියෝජිතයෝ සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ උත්සන්න වන මානුෂීය අර්බුදය සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට ඉන්දීය මධ්‍යම ආණ්ඩුවට නිශ්චිත දින වකවානු නියම කරන ලද සර්ව පාක්ෂික සමුළුව, එසේ නොකරන්නේ නම් පාලක එක්සත් ප්‍රගතිශීලී සන්ධානයට ඉන්දීය මධ්‍යම පාර්ලිමේන්තුවේ සහාය දක්වන විවිධ තමිල්නාඩු පක්ෂ නියෝජිතයින් 39 දෙනෙක් සිය මන්ත්‍රී ධූරවලින් ඉල්ලා අස්වන බවට විවෘත දැනුම්දීමක් කළේය. ඉන්දු - ඇමරිකානු න්‍යෂ්ටික ගිවිසුමට එරෙහිව මතු වූ විරෝධයෙන් සිය පාර්ලිමේන්තු බහුතරය අසීරුවෙන් ආරක්ෂා කරගත් නවදිල්ලි පාලනය සොළවාලීමේ අභියෝගය ලාංකීය දෙමළ ජනයාගේ ඉරණම විසින් යළිත් මතු කරනු ලැබිණ.

හතරවෙනි ඊළම් යුද්ධය මූලික කොටගෙන කලාපීය සහ ගෝලීයව ගොඩනැගුණු නව  සන්ධානයන්ගේ ස්වරූපය පිළිබඳව මීට කලින් මෙම ලියුම්කරු විසින් ලියන ලද ලිපි පෙළක් මගින් පැහැදිලි කරන ලදී. ඉහළින් නිර්මාණය වූ එකී දේශපාලන අක්ෂයේ පැවැත්ම අස්ථාවර කිරීමට තර්ජනය කර සිටින නව බහුජන අක්ෂයක් ඉන්දු උප මහාද්වීපය තුළින්ම මතුවීම දකුණු ඉන්දීය විරෝධතාවන් විසින් සළකුණු කරන ලදී. එහි වර්ධනයේ ස්වභාවය ඉදිරියේදී තව දුරටත් සළකා බැලිය යුතුව තිබේ.

(මතු සම්බන්ධයි)

**රවීස**
*raveesa@googlemail.com*

*රාවය / 2008 නොවැම්බර් 23*